..............................දිස්ත්‍රික් සමෘද්ධි ව්‍යාපාරික සංගමයේ ව්‍යවස්ථාව

| | | |
|---|---|---|
| 1 | සංවිධානයේ නම හා ලිපිනය | .................... දිස්ත්‍රික්කයේ සමෘද්ධි ව්‍යාපාරික සංගමය |
| 2 | සංවිධානයේ බල ප්‍රදේශය | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් නිර්ණය කර ඇති පරිපාලන දිස්ත්‍රික්කයේ සීමාව |
| 3 | අරමුණු | 3.1. දිස්ත්‍රික්කය තුල පිහිටුවා ඇති ව්‍යාපාරික සංගම් වල ඒකාබද්ධතාවයක් ඇති කිරීම<br>3.2.එම ව්‍යාපාරික සංගම් වල ඒකාබද්ධ වැඩසටහන් තුලින් ව්‍යාපෘති අවස්ථා පුළුල් කිරීම |
| 4 | ඉලක්ක | 4.1.දිස්ත්‍රික්කය තුල විසිරී සිටින සමෘද්ධි ව්‍යාපාර සංවිධාන ගත කිරීම.<br>4.2.සමෘද්ධි සන්නාමය සහිත නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වා දීම<br>4.1.සමෘද්ධි නිෂ්පාදනවල ගුණාත්වය ඉහළ නැංවීම<br>4.2.වෙළඳපල ගැටළු හා අභියෝග සඳහා සාර්ථකව මුහුණ දීමට සූදානම් කිරීම.<br>4.3.රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනික ප්‍රතිපත්ති තුළින් සමෘද්ධි නිෂ්පාදකයින්ට වන යහපත් හා අයහපත් බලපෑම් පිළිබඳව දැනුවත් කිරීම.<br>4.4.නව ව්‍යාපාරික හා වෙළඳපොල දැනුම අත්දැකීම් හා තොරතුරු හුවමාරුව<br>4.5.ජාතික හා අන්තර්ජාතික වෙළඳ ප්‍රජාව හා සම්බන්ධ කිරීම<br>4.6.ව්‍යාපාරික නීති , ආචාරධර්ම, යුතුකම්,වගකීම් හා පාරිභෝගික අයිතීන් පිළිබඳව දැනුම ලබාදීම.<br>4.7.සෑම ව්‍යාපාරයක්ම ලියාපදිංචි ව්‍යාපාරයක් බවට පත් කිරීම<br>4.8. සෑම ව්‍යාපාරයකටම නීතිමය පුද්ගලභාවයක් ලබාදීම. |
| 5 | සාමාජිකත්වය | 5.1.ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා ඇති ව්‍යාපාර සංගම්වල සභාපතිවරු හෝ බලය පැවරූ නිලධාරීන්<br>5.2.සාමාජිකත්වය සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලීම මහා සභාවේදී සම්මත විය යුතුය.<br>5.3.ප්‍රථම සාමාජික ගාස්තුව ගෙවූ දිනය සාමාජිකත්වය හිමිවූ දිනය ලෙස සැලකේ. |
| 6 | සාමාජිකත්වය අහෝසි වීම | 6.1. ප්‍රාදේශීය ව්‍යාපාරික සංගමය විසිරුවා හැරීම.<br>6.2. දිස්ත්‍රික් ව්‍යාපාරික සංගමයේ මහා සභාවේ තීරණයට අනුව |
| 7 | සාමාජික ගාස්තු | 7.1.මහා සභා රැස්වීමකදී සාමාජික බහුතරයකගේ කැමැත්ත පරිදි තීරණය විය යුතුය.<br>7.2. වාර්ෂිකව අවම වශයෙන් රු.1000.00 විය යුතුය. |
| 8 | අනුශාසක මණ්ඩලය | 8.1. දිස්ත්‍රික් ලේකම්<br>8.2.දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ<br>8.3.සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ<br>8.4.දිස්ත්‍රික් අලෙවි විෂය භාර නිලධාරියා |
| 9 | විධායක සභාව | 9.1.පහත නිලධාරින්ගෙන් සමන්විත වේ.(ගණන් පරීක්ෂක හැර ඔත්තේ සංඛ්‍යාවක් විය යුතුය.)<br>9.1.1සභාපති<br>9.1.2 උප සභාපති<br>9.1.3.ලේකම්<br>9.1.4.භාණ්ඩාගාරික<br>9.1.5.කාරක සභිකයින් (සංඛ්‍යාව මහා සභාව විසින් තීරණය කළ යුතුය.) |

| | | |
|---|---|---|
| | | 9.1.6. ගණන් පරීක්ෂක (ජන්ද බලය නොමැත) |
| 10 | මහා සභා රැස්වීම | 10.1. වාර්ෂිකව රැස්විය යුතුය.<br>10.2.විධායක සභාව සඳහා නව නිලධාරී මඩුල්ලක් පත් කර ගැනීම මහා සභා රැස්වීමේදී සිදු කල යුතුය<br>10.3. නියමිත කාලයට පෙර මහා සභා රැස්වීමක් පැවැත්වීමට අවශ්‍යයයි සාමාජිකත්වයට හැගෙන්නේ නම් එවැනි ඕනෑම අවස්ථාවක මුළු සාමාජිකත්වයෙන් 2/3 ක ලිඛිත ඉල්ලීමක් මගින් සිදු කල හැක.<br>10.4. ව්‍යාවස්ථාව සම්මත කර ගැනීම හා ව්‍යවස්ථා සංශෝධනය සඳහා යෝජනා ස්ථිර කර ගැනීම මහා සභාවකදී කළ යුතුය. |
| 11 | විධායක සභාවේ බලතල සහ වගකීම් | 11.1. සෑම මාස 03 කට වරක් රැස්විය යුතුය.<br>11.2.සභාපතිවරයා සභාව මෙහෙයවීම සිදුකළ යුතු අතර සභාපති නොමැති අවස්ථාවලදී උප සභාපති සභාව මෙහෙය විය යුතුය.<br>11.3.ලේකම් විසින් රැස්වීම් සඳහා සාමාජිකයින් කැඳවීම , සියළු රැස්වීම් වාර්තා සටහන් තබා ගැනීම සහ ඉදිරිපත් කිරීම  කල යුතු අතර, ලේකම් නොමැති අවස්ථා වලදී උප ලේකම් විසින් මෙම කාර්යය කල යුතුය.<br>11.4. භාණ්ඩාගාරික විසින් සංගමය සතු සියළුම අරමුදල් , වත්කම් හා වගකීම ලේඛණගත කිරීම සහ අයවැය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.<br>11.5. ගණන් පරීක්ෂක විසින් ගිණුම් වාර්තා පරීක්ෂා කර එහි නිරවද්‍යතාවය තහවුරු කල යුතුය. |
| 12 | අරමුදල් | සාමාජික මුදල් ,රජය හා වෙනත් පුද්ගලයින්, පුද්ගලික ආයතන මගින් කරනු ලබන පරිත්‍යාග වලින් හෝ සංගමය මගින් නීත්‍යානුකූලව උපයා ගත් අරමුදලින් සමන්විත වේ. |
| 13 | මුදල් හා වත්කම් පාලනය | 13.1.සියළුම මුදල් සමෘද්ධි ව්‍යාපාරික සංගමය නමින් විධායක කමිටුවේ තීරණය මත ප්‍රජා මූල බැංකුවේ සාමාජික නොවන ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යා යුතුය.<br>13.2.ගිණුම මෙහෙය වීමේ බලය භාණ්ඩාගාරික සමඟ සභාපති සහ ලේකම් යන දෙදෙනාට පැවරිය යුතුය<br>13.3. සෑම ආදායමක් හා වියදමක් විධායක සභාවේදී පරීක්ෂාවට ලක්විය යුතු අතර , සංවිධානය සතු දේපල සුරක්ෂිත කල යුතුය.<br><br>13.4.සමෘද්ධි දිස්ත්‍රික්  ව්‍යාපාරික සංගම් අරමුදල අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ රජයේ විගණන  නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්කල හැකි අතර, ඒ සඳහා අවශ්‍ය පරිදි සියළු ගනුදෙනු සහ ලිපිලේඛන පවත්වා ගත යුතු වේ. |
| 14 | ව්‍යවස්ථා සංශෝධනය | මහා සභාවේ බහුතර එකඟතාවයෙන් කළ යුතුය. |